රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 30/2017

මගේ අංකය: EST-7/ALOWN/06/0719/21(VII)
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.12.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් ලෙස සේවය කිරීම වෙනුවෙන් හා සහාය කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2008.12.22 දිනැති 24/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එහි සඳහන් ගෙවීම් 2018.01.01 දින සිට පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| I. | මාණ්ඩලික ශ්‍රේණි තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | - එක් පුද්ගලයෙකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම වෙනුවෙන් රු. 75.00 ( රුපියල් හැත්තෑපහයි.) |
| II. | මාණ්ඩලික ශ්‍රේණි ඇතුළත, ශ්‍රේණියක සිට ශ්‍රේණියකට උසස් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පවත්වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | - එක් පුද්ගලයෙකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම වෙනුවෙන් රු. 55.00 ( රුපියල් පනස්පහයි.) |
| III. | මාණ්ඩලික නොවන ශ්‍රේණි තනතුරකට සුදුස්සන් තෝරා ගැනීම සඳහා හෝ මාණ්ඩලික නොවන ශ්‍රේණිය ඇතුළත උසස් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පවත්වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | - එක් පුද්ගලයෙකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම වෙනුවෙන් රු. 30.00 ( රුපියල් තිහයි.) |
| IV. | ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරකට සුදුස්සන් පත් කිරීම සඳහා හෝ ප්‍රාථමික ශ්‍රේණියේ ඇතුළත උසස් කිරීම සඳහා සුදුස්සන් තෝරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | - එක් පුද්ගලයෙකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම වෙනුවෙන් රු. 15.00 ( රුපියල් පහළවයි.) |

02. සතියේ වැඩ කරන දිනක පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සාමාජිකයන් සඳහා ඉහත සඳහන් කැලි පදනම මත ගෙවීම් කිරීමේ දී එක් සාමාජිකයෙකුට ලැබෙන මුළු දීමනාව රුපියල් 750.00කට අඩු වන්නේ නම් එම මණ්ඩලයේ සාමාජිකයන්ට කැලි පදනම මත නොගෙවා දිනකට රුපියල් 750.00 බැගින් දීමනාවක් ගෙවීමට හැකි ය.

03. සති අන්ත හෝ රජයේ නිවාඩු දිනක පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ වෙනුවෙන් ඉහත පළමු ඡේදයේ සඳහන් කෑලි පදනම මත ගෙවීමට අමතරව 2013.10.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013හි විධිවිධාන අනුව නිලධරයාට හිමි නිවාඩු දින වැටුප ද ගෙවිය හැකි ය.

04. ඉහත 03 ඡේදයේ සඳහන් දීමනාවට හිමිකම් ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිලධරයන්ට 02 ඡේදය යටතේ සඳහන් කර ඇති දීමනා ලැබීමට හිමිකම් නැත.

05. **සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල සහාය කාර්ය මණ්ඩල නිලධරයන් සඳහා වූ දීමනා**

සති අන්ත සහ රජයේ නිවාඩු දිනවලදී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයන්හි සහාය රාජකාරි සඳහා සහභාගි වන නිලධරයන් වෙනුවෙන් පහත සඳහන් පරිදි දීමනාවක් ගෙවිය හැකි ය. මෙම දීමනාවන්ට අමතරව කිසිදු දීමනාවක් එම නිලධරයන්ට නොගෙවිය යුතු ය.

| | නිලධර ගණය | එක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට අයත් විය යුතු උපරිම සහාය කාර්ය මණ්ඩල සංඛ්‍යාව | දිනක උපරිම දීමනා |
|---|---|---|---|
| I. | මාණ්ඩලික නිලධරයන් | 01 | 2013.10.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013හි විධිවිධාන අනුව නිවාඩු දින වැටුප හෝ රු.1400/- (රුපියල් එක්දහස් හාරසියයයි.) |
| II. | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය හෝ ඒ හා සමාන්තර ශ්‍රේණි | 02 | රු.800/- (රුපියල් අටසියයයි.) |
| III. | කාර්යාල සේවක සේවය | 01 | රු.500/- (රුපියල් පන්සියයයි.) |
| IV. | රියදුරු | 01 | රු.500/- (රුපියල් පන්සියයයි.) |

06. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය